සිය පාසල් සමය අනවශ්‍ය අතපෙවීම්වලින් තොරව සම්පූර්ණ කර ගන්නට බාලයන්ට නිදහස තිබිය යුතු බව, දෙස් විදෙස් මාධ්‍ය ආචාරධර්ම පවසයි.

නමුත් ඇතැම් මාධ්‍ය ඒ පිළිබඳව කෙතරම් දැනුවත්ද යන්න පැනයකි.

පාසලේ සිදු වූ ගැටුමක් හේතුවෙන්, පියෙකු, පාසල නිමවී නිවසට යමින් සිටි තවත් දරුවෙකුට පහර දීමේ පුවතක් දිනමිණ (ඔක්. 05, 2022) දක්වයි. මෙම පුවත තුළ, එම පහර දීමට ලක්වූ දරුවාගේ නම, ලිපිනය, පාසැල සහ ඉගෙනුම ලබන පංතියද සඳහන් වේ.

1) පාසලේ සිදු වූ ගැටුමක් මුල් කරගනිමින් ඇති වූ මෙම සිදුවීමේ ස්වභාවය දෙස බලන විට, මෙම දරුවාගේ අනන්‍යතාවය හෙළි වන තොරතුරු මෙතරම් දුරට පළ කිරීම අවශ්‍යද?

2) ඉන් එම දරුවාගේ පාසල් අධ්‍යාපනයට හානියක් සිදු නොවනු ඇතැයි සහතික විය හැකිද?

සිය අධ්‍යාපනය අනවශ්‍ය අතපෙවීම්වලින් තොරව සම්පූර්ණ කරගැනීමට බාලයන්ට ඉඩ තබමු!